# පාස්කු ප්‍රහාරය හා සබැඳිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයන්හී විභාග වන නඩු ත්‍රිත්වයක් සම්බන්ධයෙන් 2022 ජනවාරි මස සිට 2022 මාර්තු මස දක්වා සමස්ත නිරීක්ෂණ වාර්තාව[1]

2019 අප්‍රේල් මස 21 වන දින එනම්, පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාරය හා සබැඳිව හිටපු පොලිස්පතිට එරෙහිව, හිටපු ආරක්ෂක ලේකම්වරයාට එරෙහිව සහ සැකකරුවන් 25 දෙනෙකුට එරෙහිව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණයන්හී වෙන් වෙන් වශයෙන් නඩු ත්‍රිත්වයක් විභාගයට ගන්නා ලදී.

## පටුන


**1වැනි කාණ්ඩය: සාරාංශ වගුව (Summary table(.................................................2**

**2 වැනි කාණ්ඩය: නවුෆර් මවුලවී ඇතුලු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB) 2972/21 ..........................................................4**

**3 වැනි කාණ්ඩය: හිටපු පොලිස්පතිට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB) 2900/21.................................................................................5**

**4 වැනි කාණ්ඩය: හිටපු ආරක්ෂක ලේකම්ට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB)2899/2021..........................................................................8**

## 1වැනි කාණ්ඩය: සාරාංශ වගුව (Summary table)

| | HC (TAB) 2972/21 | HC (TAB) 2900/21 | HC (TAB) 2899/2021 |
|---|---|---|---|
| විත්තිකරු | නවුෆර් මවුලවී ඇතුළු විත්තිකරුවන් විසි පස් දෙනෙකු | හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර | හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු |
| විනිසුරුවරුන් | දමිත් තොටවත්ත, අමල් රණරාජා, නවරත්න මාරසිංහ යන ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල[2] | නාමල් බලල්ලේ, ආදිත්‍ය පටබැඳිගේ සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල | නාමල් බලල්ලේ, ආදිත්‍ය පටබැඳිගේ සහ මොහොමඩ් ඉර්ෂඩීන් යන ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල |
| චූදිතයන් / විත්තිකරුවන් සඳහා වූ නීතිඥවරුන් | පළමුවන හා 10 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හමීඩ් ,<br><br>2 වන හා 14 වන විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ රිස්වාන්,<br><br>4 වන සහ 15 වන විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ අසාද් මුස්තාෆා,<br><br>5 වන සහ 16 වන විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ ඉම්ටියාස් වහාබ්,<br><br>6 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ සචිනි වික්‍රමසිංහ, | නීතිඥ රොෂාන් දෙහිවල මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් | ජනාධිපති නීතිඥ මොහාන් වීරකෝන් මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් |

| | | | |
|---|---|---|---|
| | 9 වන විත්තිකරු වෙනුවෙන් නීතිඥ ගසාලි හුසේන්,<br><br>22, 23 සහ 24 යන විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ විජිතානන්ද මඩවලගම | | |
| රජයේ නීතිඥවරුන් | අතිරේක සොලිසිටර් ජෙනරාල් හරිප්‍රියා ජයසුන්දර, ලක්මාලි දිසානායක සහ තවත් නීතිඥවරුන් | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් |
| අගතියට පත් පාර්ශ්වයන් සඳහා වූ නීතිඥවරුන් | නීතිඥ සුරේන් ඩී. පෙරේරා, නීතිඥ අමිල සුයාම එගොඩමහවත්ත, නීතිඥ මනෝජ් නානායක්කාර | නීතිඥ සුරේන් ඩී. පෙරේරා , නීතිඥ එස්.කේ. සේනාරත්න, නීතිඥ ගීවා නිල්මල්ගොඩ | නීතිඥ සුරේන් ඩී. පෙරේරා, නීතිඥ එස්.කේ. සේනාරත්න, නීතිඥ ගීවා නිල්මල්ගොඩ |
| නඩුව අධිකරණයේ අසන ලද / කැඳවන ලද දින | 2022.01.12<br><br>2022.03.03 | 2022.01.18<br><br>2022.01.19<br><br>2022.01.20<br><br>2022.02.18 | 2022.01.18<br><br>2022.01.19<br><br>2022.02.18 |
| ඊළඟ නඩු දිනය සහ වේලාව | 2022.05.12 - පස්වරු 1.30 | ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ල විසින් විත්තිවාචක නොකැද වීමට තීරණය කර සියලු චෝදනාවන්ගෙන් චූදිත නිදොස් කර ඇත. (නඩුව අවසන්) | ත්‍රි පුද්ගල විනිසුරු මඩුල්ල විසින් විත්තිවාචක නොකැද වීමට තීරණය කර සියලු චෝදනාවන්ගෙන් චූදිත නිදොස් කර ඇත. (නඩුව අවසන්) |

## 2 වැනි කාණ්ඩය: නවුෆර් මවුලවී ඇතුලු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB) 2972/21

**2022 ජනවාරි මස 12 වන දින**[3] පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම, ආධාර අනුබලදීම ඇතුළු චෝදනා 23270ක් යටතේ නවුෆර් මව්ලවි ඇතුළු විත්තිකරුවන් 25 දෙනෙකුට එරෙහිව පවරා ඇති නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ලක් හමුවේ කැඳවනු ලැබිය. මෙදින නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් හරිප්‍රියා ජයසුන්දර මහත්මිය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරමින් අධිචෝදනා දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමට තවත් කාලය අවශ්‍ය බව සඳහන් කළාය[4]. ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් දෙමළ භාෂාව කතා කරන නීතිඥවරුන් 9 දෙනෙකු එවා තිබූ අතර, එම නීතිඥවරුන්ව නීතිඥ නියෝජනයක් නොතිබූ චූදිතයන්ගේ නීතිඥයන් ලෙස විධිමත්ව පත් කරන ලදී[5]. එබැවින් විත්තිකරුවන් 25 දෙනා වෙනුවෙන්ම නීතිඥ නියෝජනයක් ඇත[6].

22, 23 සහ 24 වැනි විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥවරයා ඇප ඉල්ලීමක් ඉදිරිපත් කළ නමුත් අනෙක් විත්තිකරුවන්ගේ ඇප ඉල්ලීම්වලට සවන් දීමෙන් පසු පොදු කරුණු දැක්වීමක් කරන බව අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමිය අධිකරණයට දන්වා සිටියාය[7]. ඒ අනුව ඉදිරි දිනයේදී ඔවුන් සියලු දෙනාටම ඇප ඉල්ලීම් කළ හැකි බව අධිකරණය විත්තියේ නීතිඥවරුන්ට දැනුම් දෙන ලදී[8]. වින්දිතයින් 13 දෙනෙකු වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා පෙනී සිටි අතර අගතියට පත් අනෙක් පාර්ශවයන්ගේ නීතිඥවරුන් අධිකරණය ඉදිරියේ පෙනී සිටියේ නැත[9]. අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥවරයකු වෙත, තමන් මීට පෙර අවස්ථාවකදී නඩු පිටපතක් (brief) භාර දුන් බව අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමිය අධිකරණයට දන්වා සිටියාය[10].

**2022 වර්ෂයේ මාර්තු මස 03 වන දින** මෙම නඩුවේ අධි චෝදනා පත්‍ර වල දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමිය විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලදී[11]. විත්තිකරුවන්ට ඇප ලබාදීම සම්බන්ධයෙන් නීතිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය බවද ඇය වැඩිදුරටත් පැවසුවාය[12]. ඇය විසින් අධිචෝදනා පත්‍ර වලට අනුව එක් එක් විත්තිකරුවන්ට එරෙහි චෝදනා ඇතුළත් ලිපි ලේඛන වෙන වෙනම අධිකරණයට ඉදිරිපත් කරන ලදී[13]. චූදිතයන්ට අදාල අධිචෝදනා සාරාංශ ගත කරන ලද වගු වෙන් වෙන් වශයෙන් අධිකරණය විසින් චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥයන්ට ලබාදෙන ලදී[14]. මෙම නඩුව 2022 වර්ෂයේ මැයි මස 12 වනදා කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය සඳහා කැඳවීමට නියමිතය[15].

## 3 වැනි කාණ්ඩය: හිටපු පොලිස්පතිට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB) 2900/21

**2022 වර්ෂයේ ජනවාරි මස 18 වන දින,** පාස්කු ත්‍රස්ත ප්‍රහාරය වළක්වා නොගැනීමෙන් සිය රාජකාරිය පැහැර හැරීම ඇතුළු අධිචෝදනා ලැබ සිටින හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාට එරෙහි[16] නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ[17] යළි කැඳවන ලදී . මෙදින බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා මෙම නඩුවේ සාක්ෂි ලබා දෙන ලදී[18]. රාජ්‍ය බුද්ධි අංශය විසින් 2019 අප්‍රේල් මස 9 වැනි දින ජාතික බුද්ධි අංශ ප්‍රධානියා වෙත යොමුකළ තොරතුර ඉහළ සිට පහළට යොමුකරන ලද තවත් එක් බුද්ධි තොරතුරක් බවට පත්ව තිබුණේ යැයි දේශබන්ධු තෙන්නකෝන් මහතා මෙහිදී සඳහන් කළේය[19]. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙම පාස්කු ප්‍රහාරය සම්බන්ධව ලැබූ තොරතුර නිශ්චිත නොවූ බව පවසන ලදී.[20]. බුද්ධි තොරතුරු පිළිබඳව සියලු වගකිව යුතු අංශ එකාබද්ධව සාකච්ඡා කර කඩිනමින් පියවර ගත්තේ නම් පාස්කු ප්‍රහාර මාලාව බොහෝදුරට වළක්වා ගැනීමේ හැකියාවක් තිබූ බව ඔහු වැඩිදුරටත් පවසන ලදී.[21] සාක්ෂිකරු දින තුනක කාලයක් සඳහා නිවාඩු ඉල්ලුම් කර ඇති අතර අප්‍රේල් 21 වන දින නිවාඩු ලබා සිට ඇත[22]. බස්නාහිර දකුණ නියෝජ්‍ය පොලිස්පති ඒ අනුව සාක්ෂිකරුගේ නිවාඩු කාලය තුළ සාක්ෂිකරු වෙනුවෙන් වැඩබැලීමට පත් කර ඇත[23]. එමෙන්ම සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද්දේ පාස්කු සිද්ධිය ගැන දැනුවත් වූ විට තමන් නිවාඩුවෙහි සිටිය ද තම බල ප්‍රදේශයට පැමිණි බවයි[24].

2022 ජනවාරි මස 18 වන දිනදී සාක්ෂිකාර බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීමක් (විත්තිකරුගේ නීතිඥවරයා විසින්) ද සිදු කරන ලදී[25]. එහිදී 2019 අප්‍රේල් මස 9 වැනි දිනැතිව පොලිස්පති වෙත එවූ ලිපියක් සාක්ෂිකරු හඳුනාගන්නා ලදී[26]. හිටපු පොලිස්පති විසින් මෙම ලේඛනය නිලධාරීන් සිවු දෙනෙකු වෙත යවා ඇති බව[27] ද එහිදී අනාවරණය විය. හිටපු පොලිස්පති තුමන් අදාළ අංශ දැනුවත් කළ නිසාවෙන් මෙම තොරතුරු සාක්ෂිකරු වෙත ලැබුණේය යන්න මෙහිදී පිළිගන්නා ලදී[28].

**2022 වර්ෂයේ ජනවාරි මස 19 වන දින** මෙම නඩුව කැඳවන ලද අවස්ථාවේ පැමිණිලි පාර්ශවය සාක්ෂි ලෙස ලකුණු කර තිබූ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතා, විත්තිකාර හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත යොමු කර තිබූ බුද්ධි වාර්තා අඩංගු ලේඛන 38කට අදාල මුල් ලේඛන අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා සාක්ෂිකරුවකු මෙදින කැඳවා තිබුණි[29]. සාක්ෂිකරු මාර්ගයෙන් අදාළ මුල් ලේඛන ලකුණු කෙරුණු අතර, ඇතැම් ලේඛනවල අසම්පූර්ණතා ඇති බවත් එකිනෙකට වෙනස් ලේඛන පවතින බවත් අධිකරණයේ නිරීක්ෂණයට ලක් විය[30]. යම් විමර්ශනයක් සිදු කළ විට, ඊට අදාළ සම්පූර්ණ වාර්තා අධිකරණයට හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පොලිසිය ක්‍රියා කළ යුතු බව, ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලේ සාමාජික විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ මහතා විසින් විවෘත අධිකරණයේ ප්‍රකාශ කරන ලද බවට වාර්තාවේ[31]. මෙවැනි දේ හරහා සිදුවන්නේ අපරාධ විමර්ශන ක්‍රියාදාමය කෙරෙහි මහජනතාව තබා ඇති විශ්වාසය බිඳ වැටීම බවත් විනිසුරු ආදිත්‍ය

පටබැඳිගේ මහතා සඳහන් කළ බවට වාර්තා වේ.[32]. එමෙන්ම, පැමිණිලි පාර්ශවය මෙම නඩුවට අදාළව ලකුණු කර තිබූ ලේඛන පරීක්ෂා කළ ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ලේ සභාපති විනිසුරු නාමල් බලල්ලේ මහතා විසින්, පැමිණිලි පාර්ශවය මෙම නඩුව ගොනු නොකර සිටිය යුතුව තිබූ බවට විවෘත අධිකරණයේ සඳහන් කළේ යැයි වාර්තාවේ[33]. සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් පවසා සිටින ලද්දේ, රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන විසින් යොමු කර තිබූ ලිපි 31 අතුරින් බහුතරයක් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස විත්තිකරු විසින් සටහන් යොදා ඇති බවයි[34]. පැමිණිල්ල විසින් ලකුණු කළ බුද්ධි වාර්තා අඩංගු ලේඛන අතුරෙන් වාර්තා විසි එකක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලිස්පතිවරයා විසින් සටහන් යොදා තිබූ බවත් අධිකරණය හමුවේ අනාවරණය විය.[35].

**2022 වර්ෂයේ ජනවාරි මස 20 වන දින** කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ මෙම නඩුව යළි කැඳවන ලද[36] අවස්ථාවේ පැමිණිල්ල වෙනුවෙන් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා ගරු අධිකරණය ඉදිරියේ දිවුරුම්පිට සාක්ෂි ලබා දීම සඳහා කැඳවන ලදී[37]. පැමිණිල්ලේ සාක්ෂි සහ ලේඛන ලකුණු කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව චූදිත වෙනුවෙන් විත්තිවාචක කැඳවනවාද නැතිද යන තීන්දුව ලබා දීම සඳහා ඉදිරි දිනය වශයෙන් 2022 පෙබරවාරි මස 18 වන දින ලබා දෙන ලදී[38].

**2022 වර්ෂයේ පෙබරවාරි මස 18 වන දින** ද මෙම නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ කැඳවන ලද අතර හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතාව විත්තිවාචක නොකැඳවාම නිදොස්කොට නිදහස් කිරීමට[39] ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල ඒකමතිකව නියෝග කරන ලදී[40]. මෙදින අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කිරීම වැදගත්වේ.

### ❖ ***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) හී හඳුනාගත හැකි විශේෂ කරුණු සරලව.**

- මෙම නඩුවේ චූදිතව සිටි පූජිත් ජයසුන්දර මහතාට එරෙහිව චෝදනා 855ක් පැවතියද එම සියලු වැරදි දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු බවට[41] පෙනී යයි. ඒ අනුව සැබවින්ම මෙහිදී ප්‍රශ්නගතව ඇත්තේ, නඩුවේ ප්‍රශ්නගත චෝදනා 855ක් ලෙස දැක්වුවද, දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තියේ දැක්වෙන **අනුබලදීමේ වරද** සිදු කරන ලද්දේද යන කාරණය බව පෙනී යයි.
- 'යමක් කිරීමට අනුබලදීම' සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය සළකා බැලීමේදී "යම් දෙයක් කිරීමට යම් **ක්‍රියාවකින්** හෝ **නීතිවිරෝධී නොකර හැරීමකින්** <u>ඕනෑකමින්ම උපකාර කරන්නෙක්</u> එය කිරීමට අනුබල දෙන්නෙක් වේ.[42]" යන්න දැක්වීම වැදගත් වේ. ඒ අනුව අනුබලදීම සම්බන්ධයෙන් නීති විරෝධී නොකර හැරීමේ ඇති සම්බන්ධය පැහැදිලි වේ.
- පූජිත් ජයසුන්දර මහතාව වරදකරු ලෙසට සැලකිය යුතු තත්ත්වයක වගකීමට යටත් කිරීමට තරම් නොකර හැරීමක් සිදු කර ඇති බවට ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත්ව නැති බව විනිසුරුවරුන්ගේ

ස්ථාවරය බව අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ දැක්වේ[43]. පැමිණිලිකාර පාර්ශවය විසින් නොකර හැරීම පමණක් කියා සිටීම ප්‍රමාණවත් නොවන අතර, කළ යුතුව තිබූ කාර්යය සහ ඉන් චූදිත නොකළ කාර්යය නැතහොත් ඉටු නොකළ වගකීම කුමක් ද යන්න ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් කර සනාථ කළ යුතු වේ[44]. මෙහිදී පැමිණිලි පාර්ශවය එම වගකීම ඉටු කිරීමට කටයුතු කර නැති අතර, ඊට සමත්ව නැත[45].

- මෙම නඩුවේදී 1200ක් පමණ සාක්ෂිකරුවන් ප්‍රමාණයක් නම් කර සිටියද, නඩු විභාගයේදී සාක්ෂියට කැඳවා තිබුණේ ඒ අතරින් සාක්ෂිකරුවන් 6 දෙනෙකුන් පමණ[46] ඉතාමත් සුළු ප්‍රමාණයකි.
- "... **නීතිපතිවරයා විසින් මෙම නඩුවේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර දෙවරක් ඒ පිළිබඳව සලකා බැලිය යුතු ව තිබූ බව අප ගේ විශ්වාසයයි**.[47]" යනුවෙන් අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන්ය.
- "... අපගේ ස්ථාවරය වන්නේ, ඉහත දැක්වීමට යෙදුණු කරුණු සහ නීතිමය තත්ත්වයන් යටතේ අඩු තරමින් පැමිණිල්ලේ ප්‍රධාන සාක්ෂිකරුවන්ගේ සාක්ෂිය අවසන් වීමෙන් අනතුරුව හෝ චෝදනා ඉදිරියට ගෙන යන්නේද නැද්ද යන්න සළකා බැලීම ට නීතිපතිවරයාට අවස්ථාව තිබුණද, ඉන් ද පැමිණිල්ල ප්‍රයෝජන ගෙන නැති බවයි.[48]" යනුවෙන් අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන්ය.
- ඒ.කේ.එම් පටබැඳිගේ මහාධිකරණ විනිසුරුතුමන්ගේ නියෝගයේ පහත පරිදි සටහන් තබා ඇත. එනම්, "...එකී **සංවේදී කරුණු පදනම් කරගෙන** කෙසේ හෝ යමෙකුට එරෙහිව හෝ **නඩු පැවරීම (සාක්ෂි නොමැතිව) අනුමත කළ නොහැකිය**.[49]"
- ඒ අනුව මෙම විත්ති වාචක කැඳවීම පිළිබඳ නියෝගයේදී චූදිත වූ පූජිත් ජයසුන්දර මහතාව විත්තිවාචක නොකැඳවාම සියලු චෝදනාවන්ගෙන් නිදොස් කිරීමට ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල තීරණය කර ඇත[50].
- රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන (පැමිණිල්ලේ සාක්ෂි අංක 01) මහතාගේ නොකර හැරීමක් ඇති බවට ඉඟියක් ඒ.කේ.එම් පටබැඳිගේ මහාධිකරණ විනිසුරුතුමන්ගේ නියෝගයේ සඳහන් කර ඇත. ඒ සම්බන්ධයෙන් වැඩි දුර කරුණු සඳහා නියෝගයේ 231, 232, 233, 235 ඡේද කෙරෙහි අවධානය යොමු කරන්න.

## 4 වැනි කාණ්ඩය: හිටපු ආරක්ෂක ලේකම්ට එරෙහි නඩුවේ සිදු වූ විශේෂ කරුණු - HC (TAB) 2899/2021

**2022 වර්ෂයේ ජනවාරි මස 18 වන දින** මෙම නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ විභාගයට ගන්නා ලද අවස්ථාවේ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා සාක්ෂි ලබා දෙන ලද[51] අතර පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ අධිකරණ වෛද්‍ය වාර්තා එකින් එක සාක්ෂි ලෙස පැමිණිල්ල විසින් සලකුණු කරන ලදී[52].

**2022 වර්ෂයේ ජනවාරි මස 19 වන දින** මෙම නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ විභාගයට ගන්නා ලද[53] අවස්ථාවේ පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා සහ රජයේ රස පරීක්ෂක වාර්තා අධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු විය[54]. පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සුදර්ශන ද සිල්වා මහතා අධිකරණය හමුවේ දැනුම් දුන්නේ පැමිණිල්ලේ සාක්ෂි කැඳවීම අවසන් කරන බවයි[55]. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දුට එරෙහි නඩුවෙන් ඔහුව නිදහස් කරන්නේද, නැතහොත් විත්තිවාචක කැඳ වන්නේද යන නියෝගය 2022 පෙබරවාරි මස 18 වැනිදා ප්‍රකාශ කරන බව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින් මෙදින දැනුම් දෙන ලදී[56].

**2022 වර්ෂයේ පෙබරවාරි මස 18 වන දින** ද මෙම නඩුව කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය හමුවේ කැඳවන ලද අතර හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතාව විත්තිවාචක නොකැඳවාම නිදොස්කොට නිදහස් කිරීමට[57] ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු මඩුල්ල ඒකමතිකව නියෝග කරන ලදී[58]. මෙදින අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන් කරුණු කෙරෙහිද අවධානය යොමු කිරීම වැදගත්වේ.

### ❖ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) හී හඳුනාගත හැකි විශේෂ කරුණු සරලව.

- මෙම නඩුවේ චූදිතව සිටි හේමසිරි ප්‍රනාන්දු මහතාට එරෙහිව චෝදනා 855ක් පැවතියද එම සියලු වැරදි දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමඟ කියවිය යුතු බවට[59] පෙනී යයි. ඒ අනුව සැබවින්ම මෙහිදී ප්‍රශ්නගතව ඇත්තේ, නඩුවේ ප්‍රශ්නගත චෝදනා 855ක් ලෙස දැක්වුවද දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තියේ දැක්වෙන **අනුබලදීමේ වරද සිදු කරන ලද්දේද යන** කාරණය බව පෙනී යයි.
- 'යමක් කිරීමට අනුබලදීම[60]' සම්බන්ධයෙන් නීතිමය තත්ත්වය සළකා බැලීමේදී "යම් දෙයක් කිරීමට යම් **ක්‍රියාවකින්** හෝ **නීතිවිරෝධී නොකර හැරීමකින්** ඕනෑකමින්ම උපකාර කරන්නෙක් එය කිරීමට අනුබල දෙන්නෙක් වේ.[61]" යන්න දැක්වීම වැදගත් වේ.

- හේමසිරි ප්‍රනාන්දු මහතාව වරදකරු ලෙසට සැලකිය යුතු තත්ත්වයක වගකීමට යටත් කිරීමට තරම් නොකර හැරීමක් සිදු කර ඇති බවට ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත්ව නැති බව විනිසුරුවරුන්ගේ ස්ථාවරය බව අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ දැක්වේ.[62]. පැමිණිලිකාර පාර්ශවය විසින් නොකර හැරීම පමණක් කියා සිටීම ප්‍රමාණවත් නොවන අතර, කළ යුතුව තිබූ කාර්යය සහ ඉන් චූදිත නොකළ කාර්යය නැතහොත් ඉටු නොකළ වගකීම කුමක් ද යන්න ප්‍රබල හා කාවදින සාක්ෂි ඉදිරිපත් කර සනාථ කළ යුතු වේ.[63]. මෙහිදී පැමිණිලි පාර්ශවය එම වගකීම ඉටු කිරීමට කටයුතු කර නැති අතර, ඊට සමත්ව නැත.[64].
- මෙම නඩුවේදී හේමසිරි ප්‍රනාන්දු මහතා විසින් මාධ්‍යයට කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් ද සාකච්ඡා විය. "…Well we knew certain things were happening…" යන ප්‍රකාශය චූදිත විසින් මාධ්‍යයට ප්‍රකාශ කර තිබුණ ද.[65], චෝදනාවන් හි දැක්වෙන ප්‍රහාරයන් ඉන් අදහස් වන බවට පැමිණිල්ල මඟින් අධිකරණය සෑහීමට පත් කර නැත.[66].
- ඉදිරිපත් සාක්ෂි අනුව පෙනී යන්නේ, නඩුවට විෂයගත සිද්ධිය පිළිබඳ ව රාජ්‍ය බුද්ධි සේවාව විසින්, නිශ්චිත ප්‍රමාණවත් බුද්ධි තොරතුරක්, ප්‍රහාරයට පෙර හෙළි කර ගැනීමට අපොහොසත්ව ඇති බවයි.[67].
- මෙම නඩුවේදී 1200කට අධික සාක්ෂිකරුවන් ප්‍රමාණයක් නම් කර සිටියද, නඩු විභාගයේදී සාක්ෂියට කැඳවා තිබුණේ ඒ අතරින් සාක්ෂිකරුවන් 7 දෙනෙකුන් පමණ.[68] ඉතාමත් සුළු ප්‍රමාණයකි.
- "… **<u>නීතිපතිවරයා විසින් මෙම නඩුවේ තොරතුරු වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර දෙවරක් ඒ පිළිබඳව සලකා බැලිය යුතු ව තිබූ බව අප ගේ විශ්වාසයයි</u>**.[69]" යනුවෙන් අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන්ය.
- "… අපගේ ස්ථාවරය වන්නේ, ඉහත දැක්වීමට යෙදුණු කරුණු සහ නීතිමය තත්ත්වයන් යටතේ අඩු තරමින් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගේ සාක්ෂිය අවසන් වීමෙන් අනතුරුව හෝ චෝදනා ඉදිරියට ගෙන යන්නේද නැද්ද යන්න සළකා බැලීම ට නීතිපතිවරයාට අවස්ථාව තිබුණද, ඉන් ද පැමිණිල්ල ප්‍රයෝජන ගෙන නැති බවයි.[70]" යනුවෙන් අධිකරණය විසින් ලිඛිතව ලබා දුන් නියෝගයේ සඳහන්ය.
- ඒ.කේ.එම් පටබැඳිගේ මහාධිකරණ විනිසුරුතුමන්ගේ නියෝගයේ පහත පරිදි සටහන් තබා ඇත. එනම්, "…එකී **<u>සංවේදී කරුණු පදනම් කරගෙන</u>** කෙසේ හෝ යමෙකුට එරෙහිව හෝ **<u>නඩු පැවරීම (සාක්ෂි නොමැතිව) අනුමත කළ නොහැකිය</u>**.[71]" "… පැමිණිල්ලෙන්ම ඉදිරිපත් කරන ලද සාක්ෂි අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ චූදිතට ස්වාධීනව තීරණ ගැනීමේ පරිසරයක් දේශපාලන අධිකාරිය විසින් ඇති නොකර යම්කිසි සිදුවීමක් සිදුවූ පසු ඒ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් හට වගකීම පැවරීම යුක්ති සහගත නොවන බවද සටහන් කර තබමි.[72]" " … පැමිණිල්ලෙන් මෙහෙයවන ලද සාක්ෂි සියල්ල සළකා බැලීමේදී චූදිත විසින් එවන් **<u>හුදු නොකර හැරීමක් හෝ සිදු කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොවන බව</u>** මම තීරණය කරමි.[73]" මේ

අනුව පැමිණිලි පාර්ශවය අධිකරණය හමුවේ පැමිණිල්ලේ නඩුවේදී අපරාධමය නොකර හැරීමක් තබා, හුදු නොකර හැරීමක්වත් ඔප්පු කර නැති බව පෙනී යයි.

- ඒ අනුව මෙම විත්ති වාචක කැඳවීම පිළිබඳ නියෝගයේදී චූදිත වූ හේමසිරි ප්‍රනාන්දු මහතාව විත්තිවාචක නොකැඳවාම සියලු චෝදනාවන්ගෙන් නිදොස් කිරීමට ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල තීරණය කර ඇත.[74].
- රාජ්‍ය බුද්ධි සේවාවේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන (පැමිණිල්ලේ සාක්ෂි අංක 01) මහතාගේ නොකර හැරීමක් ඇති බවට ඉඟියක් ඒ.කේ.එම් පටබැඳිගේ මහාධිකරණ විනිසුරුතුමන්ගේ නියෝගයේ සඳහන් කර ඇත. ඒ සම්බන්ධයෙන් වැඩි දුර කරුණු සඳහා නියෝගයේ 245, 246 ඡේද කෙරෙහි අවධානය යොමු කරන්න.

[1] This report based on CSR's trial monitoring on some days complimented by media reports

[2] 'Trial of 25 men accused of Easter Sunday attacks postponed to March 3' (*ColomboPage*, 12 January 2022) <http://www.colombopage.com/archive_22A/Jan12_1641972868CH.php> accessed on 29th of January 2022

**'පාස්කු නඩුව මාර්තු 3 වනදා ට කල්යයි' (*Runews*,**12 January 2022) < https://runews.lk/news/item/27169-the-easter-trial-is-set-for-march-3 > accessed on 30th of January 2022

[3] 'Trial of 25 men accused of Easter Sunday attacks postponed to March 3' (*ColomboPage*, 12 January 2022) <http://www.colombopage.com/archive_22A/Jan12_1641972868CH.php> accessed on 29th of January 2022

[4] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[5] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21**,**

'Trial of 25 men accused of Easter Sunday attacks postponed to March 3' (*ColomboPage*, 12 January 2022) <http://www.colombopage.com/archive_22A/Jan12_1641972868CH.php> accessed on 29th of January 2022

**'පාස්කු නඩුව මාර්තු 3 වනදා ට කල්යයි' (*Runews*,** 12 January 2022) < https://runews.lk/news/item/27169-the-easter-trial-is-set-for-march-3 > accessed on 30th of January 2022

[6] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[7] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[8] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[9] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[10] Trial monitoring report on 12th of January, 2022 – Case No: HC (TAB) 2972/21

[11] Trial monitoring report on 3rd of March, 2022 – Case No: HC (TAB) 2972/21

[12] Daily news, 'Easter Sunday bombings: 25 accused to stand trial' (04 March 2022) <https://dailynews.lk/2022/03/04/local/274031/easter-sunday-bombings-25-accused-stand-trial > accessed on 7th March 2022

[13] Daily news, 'Easter Sunday bombings: 25 accused to stand trial' (04 March 2022) <https://dailynews.lk/2022/03/04/local/274031/easter-sunday-bombings-25-accused-stand-trial > accessed on 7th March 2022

[14] Trial monitoring report on 3rd of March, 2022 – Case No: HC (TAB) 2972/21

[15] Trial monitoring report on 3rd of March, 2022 – Case No: HC (TAB) 2972/21

[16]Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gl0&t=1164s > accessed on 25th of January 2022 )Time duration 18:57 - 20:56(

[17] Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6.55 PM Live 2022-01-18' (18 January 2022) <**https://youtu.be/xM5frwcgK9E?t=2329>** accessed on 25th of January 2022 )Time duration 34:09 - 34:54(

[18] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gl0&t=1164s > accessed on 25th of January 2022 )Time duration 18:57 - 20:56(

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6.55 PM Live 2022-01-18' (18 January 2022) <**https://youtu.be/xM5frwcgK9E?t=2329>** accessed on 25th of January 2022 )Time duration 34:09 - 34:54(

[19] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gl0&t=1164s > accessed on 25th of January 2022 )Time duration 18:57 - 20:56(

[20] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gl0&t=1164s > accessed on 25th of January 2022 )Time duration 18:57 - 20:56(

[21] Sirasa, 'News 1st Prime Time Sinhala News – 10PM (18/01/2022) රාත්‍රී 10.00 ප්‍රධාන ප්‍රවෘත්ති' (18 January 2022) < https://www.youtube.com/watch?v=GOAEcru6gI0&t=1164s > accessed on 25th of January 2022 )Time duration 18:57 - 20:56(

Zulfick Farzan, 'Joint effort could have prevented Easter Attacks – Deshabandu' (*News 1st*, 18 January 2022) <https://www.newsfirst.lk/2022/01/18/joint-effort-could-have-prevented-easter-attacks-deshabandu/ > accessed on 31st of January 2022

[22] Chamath, 'Ex IGP made prior warning to four top Police officers.-Senior DIG | Sri Lanka News' (,18 January 2022) < https://thesinhalanews.lk/2022/01/18/ex-igp-made-prior-warning-to-four-top-police-officers-senior-dig-sri-lanka-news/ > accessed on 31st of January 2022

Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[23] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[24] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[25] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[26] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[27] Chamath, 'Ex IGP made prior warning to four top Police officers.-Senior DIG | Sri Lanka News' (,18 January 2022) < https://thesinhalanews.lk/2022/01/18/ex-igp-made-prior-warning-to-four-top-police-officers-senior-dig-sri-lanka-news/ > accessed on 31st of January 2022
Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[28] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[29] Derana 'අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

'පාස්කු ප්‍රහාරය නඩුවේ ලේඛන 6ක් ගැන ප්‍රකාශයක්' (*Runews*,19 January 2022) < https://www.runews.lk/news/item/27319-statement-on-6-documents-in-the-easter-attack-case > accessed on 30th of January 2022

'පූජිත්ට එරෙහිව ගෙනා ලේඛන පූජිත්ගේ පිහිටට' (*අයිතිය*, 20 January 2022) <https://www.aithiya.lk/12852/pujith-jayasundara-presidential-commission-of-inquiry-pasku-attack/ > accessed on 30th of January 2022

[30] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[31] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[32] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[33] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[34] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[35] Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[36] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

Derana 'අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය - 2022.01.20 | Ada Derana Prime Time News Bulletin' (20 January 2022)< https://youtu.be/1J4pC00mvbI?t=1794 > accessed on 27th of January 2022 (Time duration 29:56 – 30:34)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-20' (20 January 2022) <https://youtu.be/FIU9SDbsc78?t=1871> accessed on 27th of January 2022 (Time duration 31:11 – 31:38)

[37] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[38] Trial monitoring report on 20th of January, 2022 – Case No: HC (TAB) 2900/21

[39] Trial monitoring report on 18th of February, 2022 – Case No: HC (TAB) 2900/21

Sirasa, 'News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති' <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-02-18 < https://youtu.be/-sgw_Z_ergA?t=130 > accessed on 25th Of February 2022 (Time Duration 2:08 – 14:16)

[40] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති' <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

[41] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 4 වන ඡේදය

[42] දණ්ඩ නීති සංග්‍රහය, 100 වගන්තියේ 3 වන කොටස

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 30 ඡේදය, 34 ඡේදය, 38 ඡේදය

[43] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 182 ඡේදය

[44] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 183 ඡේදය

[45] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 183 ඡේදය

[46] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 18 ඡේදය

[47] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 190 ඡේදය

[48] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 191 ඡේදය

[49] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 257 ඡේදය

[50] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/ 2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 192, 193, 259 ඡේදය

[51] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[52] Trial monitoring report on 18th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[53]Derana ' අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

[54] Trial monitoring report on 19th of January, 2022 – Case No: HC (TAB) 2899/21

[55] Derana 'අද දෙරණ රාත්‍රී 10.00 පුවත් විකාශය - 2022.01.19 | Ada Derana Late Night News Bulletin' (19 January 2022) < https://youtu.be/o0n6qqC3Juk?t=667 > accessed on 26th of January 2022 (Time duration 11.06 – 15:24)

Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[56] Hiru, 'හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-01-19' < https://youtu.be/PW2YBQP2fFc?t=1470 > accessed on 26th of January 2022 (Time duration: 24:31 – 27:32)

[57] Trial monitoring report on 18th of February, 2022 – Case No: HC (TAB) 2899/21

Sirasa, 'News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති' <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2022-02-18 < https://youtu.be/-sgw_Z_ergA?t=130 > accessed on 25th Of February 2022 (Time Duration 2:08 – 14:16)

[58] Sirasa, 'News 1st Prime Time Sinhala News – 7PM (18/02/2022) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති' <https://youtu.be/jvS2yeAKvxs?t=95 > accessed on 25th Of February 2022 (Time Duration: 1:34 – 4:34)

[59] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 4 වන ඡේදය

[60] "යම් දෙයක් කිරීමට යම් ක්‍රියාවකින් හෝ නීතිවිරෝධී නොකර හැරීමකින් ඕනෑකමින්ම උපකාර කරන්නෙක් එය කිරීමට අනුබල දෙන්නෙක් වේ." දණ්ඩ නීති සංග්‍රහය, 100 වගන්තියේ 3 වන කොටස

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 32 ඡේදය, 34 ඡේදය, 38 ඡේදය

[61] දණ්ඩ නීති සංග්‍රහය, 100 වගන්තියේ 3 වන කොටස

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව පූජිත් සේනාධි බණ්ඩාර ජයසුන්දර* HC (TAB) 2900/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 30 ඡේදය, 34 ඡේදය, 38 ඡේදය

[62] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 173 ඡේදය

[63] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 174 ඡේදය

[64] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 174 ඡේදය

[65] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 153 ඡේදය, 155 ඡේදය

[66] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 155 ඡේදය

[67] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 173 ඡේදය

[68] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 19 ඡේදය

[69] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 180 ඡේදය

[70] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 181 ඡේදය

[71] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 259 ඡේදය

[72] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 260 ඡේදය

[73] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 261 ඡේදය

[74] *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය එදිරිව හේමසිරි ප්‍රනාන්දු* HC (TAB) 2899/2021 (විත්තිවාචක කැඳවීම පිළිබඳ නියෝගය) 182, 183, 262 ඡේදය